(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **29**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 ජුනි 06 අඟහරුවාදා පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

**ගරු අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

**ගරු ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

**ගරු නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

**ගරු ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

**ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය

**ගරු විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

**ගරු සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු (වෛද්‍ය) සීතා අරඹෑපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු වජිර අබේවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කරන ලද 'දූෂණ විරෝධී' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම්දීමට කැමැත්තෙමි.

'දූෂණ විරෝධී' නමැති පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මතු සඳහන් පරිදි වේ:—

පනත් කෙටුම්පතෙහි 1, 2(1)(f), 2(2), 3(2), 4(1)(a), 4(1)(b), 4(3), 17(1), 21, 31 (2), 163(2)(h), 40, 48(3), 49(1)(f), 50(1)(a), 53(1), 62(1), 65, 67(5 ), 71(6) හා (8), 80, 93, 99, 101, 112, 149 සහ 162 වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වේ.

කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ දක්වා ඇති සංශෝධන පනත් කෙටුම්පතට සිදු කළහොත් මෙම අනනුකූලතාවයන් නතර වනු ඇත.

ඒකී සංශෝධනයන්ට අමතරව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දක්වා ඇත්තේ පනත් කෙටුම්පතේ 8(3), 136, 141, 142 සහ 156 වගන්ති සඳහා අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් සඳහන් කර ඇති සංශෝධන මගින් පෙත්සම්කරුවන් විසින් අවධාරණය කර ඇති කරුණු ද විසඳිය හැකි බවය.

අද සභාවේ වැඩකටයුතු පිළිබඳ නිල වාර්තාවේ මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය මුද්‍රණය කරන ලෙස නියෝග කරමි.''

II

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'පළාත් සභා මැතිවරණ (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ යෝජනා කර ඇති පරිදි පනත් කෙටුම්පතේ 3 වගන්තිය සංශෝධනය කිරීමට හා 4 වගන්තිය ඉවත් කළ යුතු බවට වූ නියමයන්ට යටත්ව පනත් කෙටුම්පත හෝ එහි විධිවිධාන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යයි මම නියෝග කරමි.''

III

" 'ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ සිදු වූ නිව් ඩයමන්ඩ් සහ එක්ස්ප්‍රස් පර්ල් යන නෞකා අනතුරු පිළිබඳව කරුණු සොයාබලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ' සේවය කිරීම සඳහා ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතාගේ සභාපතිත්වය යටතේ පහත දැක්වෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ම' විසින් පත් කර ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි : —

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා''

IV

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 හි විධිවිධාන සහ 2022 නොවැම්බර් 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ඒ ඒ ආංශික අධීක්ෂණ කාරක සභාවල සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

(1) ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

(2) ප්‍රතිසංධානය සහ ජාතික සමඟිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු මර්ජාන් ෆලීල් මහතා

(3) ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

(4) ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

(5) ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

(6) බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

(7) ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු සී. බී. රත්නායක මහතා

(8) පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු ජයන්ත කැටගොඩ මහතා

(9) විදෙස් රැකියා සහ ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු ගාමිණී ලොකුගේ මහතා

(10) සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

(11) ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

(12) මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

(13) විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා"

V

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධාන සහ 2023 පෙබරවාරි 10 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

VI

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 122 හි විධිවිධාන සහ 2023 පෙබරවාරි 10 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මිලාන් ජයතිලක මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

VII

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන සහ 2023 පෙබරවාරි 10 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2023 මැයි 26 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය"

**2. ලිපි ලේඛනාදිය පිළිගැන්වීම:** (1) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2021 වර්ෂය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2022 වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2022 වර්ෂය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2022 වර්ෂය සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2022 වර්ෂය සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(viii) 2022 වර්ෂය සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2022 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2022 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා එම වාර්තා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 අංක 43 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2023.04.01 සිට 2023.04.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2021 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්; සහ

(ii) 2021 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව ඉදිරිපත් කර එම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(6) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(7) වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තව ඉදිරිපත් කර එම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(8) වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(9) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(10) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(11) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(12) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 20 දිනැති අංක 2324/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා එම නියමය සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(13) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(14) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 6(3) (අ) සහ 31 වගන්ති සමග කියවිය යුතු 117 (2) (ඩ) වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් මස 26 දිනැති අංක 2303/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2) සහ 117(3) වගන්ති යටතේ වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 02 දිනැති අංක 2304/46 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iii) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(iv) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(v) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(vi) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(vii) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(viii) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ix) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(x) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xi) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xii) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වගන්තිය සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 13 දිනැති අංක 2262/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xiii) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 127 වගන්ති සමහ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xiv) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 සැප්තැම්බර් 22 දිනැති අංක 2298/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xv) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 321 වගන්ති යටතේ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xvi) 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනතේ 3(5) වගන්තිය සමඟ කියවිය යුතු 10 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූලි 07 දිනැති අංක 2287/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xvii) 2020/2021 වර්ෂය සඳහා සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(xviii) 2021 වර්ෂය සඳහා ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xix) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(xx) 2019 වර්ෂය සඳහා ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(xxi) 2019/2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxii) 2020 වර්ෂය සඳහා ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(xxiii) 2019/2020 වර්ෂය සඳහා සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(xxiv) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(xxv) 2021 වර්ෂය සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(xxvi) 2021 වර්ෂය සඳහා ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(xxvii) 2020/2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකන් එයාලයින්ස් ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු නීතිඥ පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2ඇ, 5 සහ 5අ යන වගන්ති සමග කියවිය යුතු එකී ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු මස 08 දිනැති අංක 2292/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත; සහ

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද 2021 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) බඩල්ගම, නැගෙනහිර ගොඩිගමුව, ගමගේ වත්ත, 84 ඒ දරන ස්ථානයෙහි පදිංචි පනම්බරගේ සංජීව ප්‍රසාද් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2023.03.25 දිනැති පෙත්සම ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(2) දොඩම්ගස්ලන්ද, ලිහිණිවැහැර ජනපදය, අංක 06 දරන ස්ථානයෙහි පදිංචි පී.ඒ. ලලිත් ෆ්‍රැන්සිස් මහතාගෙන් ලැබුණු 2023.04.22 දිනැති පෙත්සම ගරු ජේ. සී. අලවතුවල මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මහගම දකුණ, උදටියාවල යන ලිපිනයෙහි පදිංචි ඩී.එස්.අයි.ඒ. ඉරේෂා නිශාමනී මහත්මියගෙන් ලැබුණු 2023.04.26 දිනැති පෙත්සම ගරු වරුණ ලියනගේ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**5. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු: පාර්ලිමේන්තුවේ සභානායකතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව,—** න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 17 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**6. සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 1):** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6(3)(අ) සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2)(ඩ) වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(පූ.භා. 11.15ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි සංචාරක රාජ්‍ය අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 12.35 ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි මහාමාර්ග රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.02ට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග (අංක 2):** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2) සහ 117(3) වගන්ති යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 02 දිනැති අංක 2304/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 1)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 2)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 3)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 4)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 5)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 6)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 7)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 8)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 9)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 06 දිනැති අංක 2261/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**17. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 10)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 13 දිනැති අංක 2262/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**18. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 11)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 127 වගන්ති සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක

2292/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**19. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 12)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු 321 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 සැප්තැම්බර් 22 දිනැති අංක 2298/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**20. වෙළඳ නැව් පනත යටතේ නියෝග (අංක 13)**: වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 321 වගන්ති යටතේ වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**21. "2019 නොවැම්බර් සිට මේ දක්වා රටේ ආර්ථිකයේ පසුබෑම පිළිබඳ සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව" ස්ථාපිත කිරීම පිණිස වූ යෝජනා සම්මතය සඳහා සංශෝධනය**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2023 මැයි 26 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළැඹි තීරණය පරිදි, 2023 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද යෝජනාව මතු සඳහන් පරිදි සංශෝධනය කළ යුතු ය:—

නාමය :

නාමය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතු ය:—

"රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරික්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව";

1 කොටස :

දෙවැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"මුදල් හා ආර්ථික කටයුතු භාර බලධාරීන් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් සිතා මතා මෙම ආර්ථික අපරාධය සිදු කළා ද යන්න පිළිබඳව විමර්ශනය කිරීම පාර්ලිමේන්තුවේ වගකීම වන හෙයින්; සහ"

තුන්වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"බදු සහන ලබා දීම, ණය වාරික නොගෙවා සිටීම, ආනයන සීමා පැනවීම, රුපියල සීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීමට ඉඩ සැලසීම, නිල සංක්‍රමණික ප්‍රේෂණ පහත වැටීම, රටේ උද්ධමනය අධි උද්ධමන තත්ත්වයක් දක්වා වැඩිවීම සහ ජීවන වියදම වැඩිවීම වැනි සාධක මෙරට මූල්‍ය බංකොලොත්භාවයට හේතු වූ හෙයින් ද;"

තුන්වැනි ඡේදයේ (අ) කොටස ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය :—

"(අ) මෙතෙක් මුහුණ නොදුන් ආර්ථික අර්බුදයකට සහ මූල්‍ය බංකොලොත්භාවයකට රටට මුහුණ දීමට සිදු වූයේ, ඒ සම්බන්ධයෙන් වගකීම් දරන ලද පුද්ගලයන් තම කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ද යන්නත්;"

තුන්වැනි ඡේදයේ (ආ) කොටස ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය :—

"(ආ) එම මූල්‍ය බංකොලොත්භාවය වැළැක්වීමට අදාළ බලධාරීන් ප්‍රමාණවත් පියවර ගත්තේ ද යන්නත්;"

තුන්වැනි ඡේදයේ (ඇ) කොටස ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය :—

"(ඇ) එවැනි ආර්ථික අර්බුදයකට සහ මූල්‍ය බංකොලොත්භාවයකට මුහුණ දීමට දායක වූ වෙනත් කරුණු තිබේ ද යන්නත්;"

තුන්වැනි ඡේදයේ (ඉ) කොටස ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය :—

"(ඉ) අනාගතයේදී රට එවැනි ආර්ථික අර්බුදයකට සහ මූල්‍ය බංකොලොත්භාවයකට පත්වීමට දායක වන්නා වූ වෙනත් කරුණු තිබේ ද යන්න; සහ"

"2023 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද යෝජනාවෙහි ඉහතින් සංශෝධනය වූ කොටස් හැර අනෙකුත් කොටස් තවදුරටත් නොවෙනස්ව පවතී"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**22. කල් තැබීම (උණ බම්බු කර්මාන්තය ප්‍රවර්ධනය):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 5.00ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුව 2023 ජූනි 07 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.